# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2121/21 - 2019 අප්‍රේල් මස 30 වැනි අඟහරුවාදා - 2019.04.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින අංක 2091/6 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත පරිදි වූ, එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2009 මැයි මස 28 වැනි දින අංක 1603/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) I වන තීරයේ දැක්වෙන "වෛද්‍ය විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූප වන්නා වූ එහි II වන තීරයේ දැක්වෙන "17" යන සටහන ඉවත් කිරීමෙන් ; සහ

(2) I වන තීරයේ දැක්වෙන "ඉංජිනේරු පීඨය" යන අයිතමය සහ ඊට අනුරූප වන්නා වූ එහි II වන තීරයේ දැක්වෙන සටහන්වලට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

| | | |
|---|---|---|
| "සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 1. | මූලික විද්‍යා අධ්‍යයනාංශය |
| | 2. | වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය |
| | 3. | හෙද විද්‍යා හා සූතිකා අධ්‍යයනාංශය |
| | 4. | ඖෂධවේදී හා ඖෂධ විද්‍යා අධ්‍යයනාංශය". |

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ දී ය.

05 - 246


1A - PG 4496 — 518 (2019/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*